රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 10/96

මගේ අංකය :- 1/543ඊ/02ඩී/09
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07
1996 මාර්තු මස 26 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,

**විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ආයතන හා වෙනත් පරිපාලන කටයුතු සම්බන්ධවත්, දීමනා හා විවිධ <u>ගෙවීම් පිළිබඳවත් කරනු ලබන නියෝජනයන් සහ විමසීම්</u>**

රාජ්‍ය සේවයේ ආයතන හා පරිපාලන කටයුතු මෙහෙයවීමේදී ඒ සඳහා උපයෝගී කර ගත යුතු අනපනත්, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, අමාත්‍යාංශ චක්‍රලේඛ ආදිය දැඩි අවධානයකින් අධ්‍යයනය කොට, එදිනෙද පැන නගින ගැටලු විසඳ ගනු වෙනුවට ඒවා ගැන අවධානය යොමු නොකොට එවැනි කරුණුවලට අදල ගැටලු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙතත්, ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙතත් යොමු කිරීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබෙයි.

02. ඉහත සඳහන් වූ ආකාරයේ ප්‍රශ්ණ නිරාකරණය කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නියේජිතයන් ගෙන්ද සමන්විත කමිටු විවිධ අමාත්‍යාංශ මගින් පත් කිරීමත්, එවැනි කමිටුවල සේවය කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නියෝජිතයන් නම් කර එවන ලෙසට ඉල්ලීම් නිතර නිතර මා වෙත යොමු කිරීමත්, උද්ගතව ඇති තවත් ප්‍රවණතාවයකි.

03. ඉහත සඳහන් ප්‍රවණතාවයන් නිසා විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් තම වගකීම තුළ ගත යුතු තිරණ ප්‍රමාද වන්නා සේම මෙම අමාත්‍යාංශය මගින් අනිවාර්යයෙන්ම සැපයිය යුතු සේවාවන්ටද සිදු කළ යුතු කාර්යයන්ට ද විශාල වශයෙන් බාධා සිදුවන බව පෙනී ගොස් ඇත.

04. ඔබගේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල පරිපාලන, ආයතන හා මුදල් කටයුතු සංවිධානය කර ගැනීමේ පූර්ණ බලතල සහ වගකීම ද අදල අනපනත්, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා අමාත්‍යාංශ චක්‍රලේඛවලට අනුකූලව එම කාර්යයන් මෙහෙයවීමේ වගකීම ද ඔබ වෙත පැවරෙන බව අවධාරණය කරන අතර, පවත්නා විධිවිධාන හා රෙගුලාසි තුළ ඔබගේ සංවිධාන ව්‍යුහයේ සංශෝධනයක් අත්‍යාවශ්‍ය යයි හැඟෙන අවස්ථාවන්හිදී ඔබ අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල පරිපාලන වගකීම දරණ නිලධාරීන්ගෙන් සමන්විත කමිටු මගින් අධ්‍යයනය කර තිරණවලට එළඹීමත්, දැනට පවත්නා පරිපාලන හෝ ආයතන කටයුතු පිළිබඳ නීතිරීති සංශෝධනයක් යෝජනා කරන විට පමණක් ඒවා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ වෙත යොමු කිරීමත් සිදු කරන ලෙස කාරුණිකව ඉල්ලමි. එබඳු ක්‍රියාමාර්ගයක් මගින් පොදු ප්‍රතිපත්ති තුළ ඒකීය භාවයක් හා ප්‍රමිතිකරණයක් ඇතිවන සේ අවශ්‍ය සංශෝධන හා අවශ්‍ය රජයේ අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශයට පියවර ගත හැකි බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

05. ඉහත සඳහන් ක්‍රියාවලිය ඔබගේ අමාත්‍යාංශ නිලධාරීන්ගේ ද ඔබ යටතේ සිටින සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ ද දැඩි අවධානය සඳහා යොමු කරන ලෙස ඉල්ලන අතර, ඒවා අනුගමනය කරන ලෙස වගකිව යුතු අමාත්‍යාංශ ලේකම්වරුන් වන ඔබගෙන් මම කාරුණිකව ඉල්ලා සිටිමි.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙණිය)
වැඩබලන ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය